3rd Proof

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2474/02 - 2026 පෙබරවාරි මස 02 වැනි සඳුදා - 2026.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී 4/1981 (II) අ

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24ඇ වන වගන්තිය සහ 24ඈ වන වගන්තිය යටතේ වන නියමය

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ විය හැකි, එම පනතේ V වන කොටසේ වෙනත් යම් විධිවිධාන සමග කියවිය යුතු 24 ඇ වන වගන්තිය සහ 24 ඈ වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පරිසර අමාත්‍ය, හෙට්ටිතන්ත්‍රි පටබැඳිගේ දම්මික වන මා විසින්, මේ නියමය මගින් -

(අ) I වන උපලේඛනයේ දක්වා ඇති ඉම් සලකුණු හා සීමා තුළ වූ භූමි ප්‍රදේශය සහ සිතියම, පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු අතර, (මේ නියමයේ “ආරක්ෂක ප්‍රදේශය” යනුවෙන් සඳහන් කරනු ලබන) එම භූමි ප්‍රදේශය “ගෝනමැරියාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවට; සහ

(ආ) II වන උපලේඛනයේ ලැයිස්තුගත කරන ලද කාරණාවලට අමතරව යම් සැලසුම් යෝජනා ක්‍රමයක් සහ ව්‍යාපෘතියක්, මේ නියමය ක්‍රියාත්මක වන දිනයේ සිට ආරක්ෂක ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීම නතර විය යුතු බවට,

ප්‍රකාශයට පත් කරමි.

**හෙට්ටිතන්ත්‍රි පටබැඳිගේ දම්මික,**
පරිසර අමාත්‍ය.

2026 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 7508 — 753 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**I වන උපලේඛනය**

1. ආරක්ෂක ප්‍රදේශයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 1.775ක් වේ.

2. ආරක්ෂක ප්‍රදේශය, උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනමැරියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වේරගම රජමහා විහාර ඉඩමේ පිහිටා ඇත.

3. ආරක්ෂක ප්‍රදේශයේ ඉම් සලකුණු හා සීමා පහත දැක්වෙන පරිදි වේ:-

උතුර - අඩි පාර

නැගෙනහිර - අඩි පාර දිගේ, ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධතියේ (ජී. පී. එස්.) නැ. 460179, උ. 953890, නැ. 460213, උ. 953829, නැ. 460242, උ. 953795 කණ්ඩාංක දිගේ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (ජී. පී. එස්.) නැ. 460254, උ. 953764 ඛණ්ඩාංක සඳහන්ව ඇති ස්ථානය දක්වා

දකුණ - මැදවච්චිය - කැබිතිගොල්ලෑව මාර්ගයේ උතුරු මායිම දිගේ අවසන් වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (ජී. පී. එස්.) නැ. 460054, උ. 953777 ඛණ්ඩාංක සඳහන්ව ඇති ස්ථානය දක්වා

බටහිර - අවසන් වරට සඳහන් කරන ලද ස්ථානයේ සිට, වේරගම රජමහා විහාර සීමාව දිගේ, ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (ජී. පී. එස්.) නැ. 460076, උ. 953830 ඛණ්ඩාංක දිගේ, ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (ජී. පී. එස්.) නැ. 460096, උ. 953874 ඛණ්ඩාංක සඳහන්ව ඇති ස්ථානය දක්වා

## 4. ආරක්ෂක ප්‍රදේශයේ සිතියම



## II වන උපලේඛනය

1. මේ නියමයේ කාර්යය සඳහා ලැයිස්තුගත කරන ලද කාරණා -

   (අ) පවතින යටිතල පහසුකම් නඩත්තු කිරීම;

   (ආ) එකී ආරක්ෂක ප්‍රදේශයේ ජෛව විවිධත්වයට බලපෑම් සිදු කිරීමකින් තොරව, පරිසර හිතකාමී ආකාරයකින් ආගන්තුක ශාක සහ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ ඉවත් කිරීම;

   (ඇ) පානය කිරීමේ කාර්ය සඳහා ජලය ලබාගැනීම;

   (ඈ) ආරක්ෂක ප්‍රදේශය යම් හානියකට, අලාභයකට හෝ දූෂණය වීමකට ලක්වීමෙන් තොරව, යම් අධ්‍යාපනික සහ පර්යේෂණ ක්‍රියාකාරකමක්;

   (ඉ) පුරාවිද්‍යා ස්ථාන කැනීම් කිරීම, සංරක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම,

විය යුතුය.

2. 1 වන අයිතමයේ ලැයිස්තුගත කරන ලද කාරණා -

   (අ) ආරක්ෂක ප්‍රදේශයේ ස්වභාවික තිරසරභාවය නොවළක්වන;

   (ආ) වන සත්ත්ව හා වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමිවලට බාධා නොවන; සහ

   (ඇ) ආරක්ෂක ප්‍රදේශය තුළ පවතින ජල උල්පත් සහ ජල මාර්ගවලට බාධා නොවන,

ආකාරයකින් සිදු කළ යුතුය.

3. 1වන අයිතමයේ ලැයිස්තුගත කරන ලද කාරණා සිදු කරගෙන යාම සඳහා වන අනුමතය, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත යුතුය.

4. මධ්‍යම පරිසර අධිකාරිය විසින්, ස්වකීය විෂය පථය යටතේ සියලුම කාරණා නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු ය.

5. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ස්වකීය කාර්යය ඉටු කිරීමේ දී ලේඛන පවත්වා ගත යුතු අතර, නිසි වාර්තා පවත්වාගෙන යාමට සලස්වනු ලැබිය යුතු ය.

6. 1 වන අයිතමයේ (ඈ) වන ඡේදයේ සඳහන් කරන ලද එකී අධ්‍යාපනික හෝ පර්යේෂණ ක්‍රියාකාරකමේ අධ්‍යයන හෝ පර්යේෂණ වාර්තාව, ආරක්ෂක ප්‍රදේශයට ගිය දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහි විධිවිධාන සලස්වා ඇති කාරණාවලට අනුකූලව කටයුතු කර නොමැති අවස්ථාවක දී, මධ්‍යම පරිසර අධිකාරිය විසින්, එකී අනනුකූලතාව පිළිබඳව අධ්‍යාපනික සහ පර්යේෂණ ක්‍රියාකාරකම සිදු කරන ලද තැනැත්තා වෙත සහ එකී තැනැත්තා නියෝජනය කරනු ලබන අදාළ ආයතනය හෝ විශ්වවිද්‍යාලය වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, එකී වාර්තාව වහාම භාරදෙන ලෙසට ඉල්ලීම් සිදු කරනු ලැබිය යුතු ය.

EOG 02 - 0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.